## වෛද්‍ය විද්‍යාව



අප්‍රිකානු නිද්‍රාබාධයෙන් පෙළෙන රෝගියෙක්

එහි ඇමරිකානු ප්‍රභේදය වූ චාගා ආබාධයෙන් පෙළෙන කාන්තාවක්

# රෝගාබාධ වලට එරෙහි සදාතනික මිනිස් සටන



සරත් රණවීර

වෛද්‍ය විද්‍යා රසායනාගාරයක් තුළදී සාමාන්‍ය මිනිස් සෛලයක් පිළිකා සෛලයක් බවට පත් කරවීමට වෛද්‍ය පර්යේෂකයන් සමත් වී තිබේ. ඒ සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි අලුත්ම ආරංචියයි. මෙම සපත්කම ඔස්සේ පර්යේෂණ කොට මිනිස් සිරුරේ සෛල, පිළිකා සෛල බවට පත්වීම වලක්වා ගත හැකි වේයයි මහත් අපේක්ෂා දැන් ඇතිවී තිබේ.

රෝගාබාධ වලින් ආරක්‍ෂා වී සිටීමට මිනිස් වර්ගයා ගත්තා ආයාසයට දීර්ඝ ඉතිහාසයක් ඇත. ඒ අනුව බිහිවූ විවිධ වෛද්‍ය ක්‍රම හා සම්ප්‍රදායයන් අප්‍රමාණ ය. රෝගාබාධ වලට එරෙහිව අනාදිමත් කාලයක් සිට මිනිසා විසින් කරන ලද සටනේ ඔහු ලද ජයග්‍රහණ කවරේ ද? මිනිසා ට විවිධ රෝගාබාධ වළඳවන පරජීවීන් (Parasites) අභිබවා ලීමට ඔහු ගත් ආයාසයේ ජය පරාජය කවරාකාර ද? ඉන් මුළුමනින්ම පරදවා ලීමට මිනිසා කෙදිනක හෝ සමත් වේද? මිනිසා රෝගාබාධ වලට එරෙහි මහා සංග්‍රාමය අනාගතයෙහි මෙහෙයවනු ඇත්තේ කවර පෙරමුණු වල ද? මේවා ඉතා වැදගත් ප්‍රශ්නයි.

රෝගාබාධ වලින් ආරක්‍ෂා වී සිටීම මිනිස් වර්ගයාගේ සදාතනික සිහිනයකි. නවීන සෞඛ්‍යාරක්‍ෂක ක්‍රම, ප්‍රතිජීවක, එන්නත්, අවයව බද්ධය හා පරිලෝකනය (Scanning) බඳු නව තාක්‍ෂණයන් නිසා, මෙම සිහිනය බොහෝ දුරට සැබෑවී තිබේ. රෝගියෙකුට හදවත අක්මාව හා පෙනහළු යන තුන් අවයවයන් එකවර බද්ධ කිරීමේ ඓතිහාසික පුවත මීට දසක දෙකකට පමණ පෙර මහා බ්‍රිතාන්‍යයෙන් වාර්තා විය. බටහිර ඇතැම් දියුණු රටවල් වසර සියයකට පෙර ඒවායේ ප්‍රචලිත රෝග සේ පැවති වසූරිය කොළරාව ගලපටලය මැලේරියාව සරම්ප හා රභස (Rabies) මේ වන විට මුළුමනින් ම තුරන් කොට ඇත. වසූරිය මුළු ලෝකයෙන් ම අතුගා දැමීම එම ජයග්‍රහණයන්ගේ මුල් දිනුම සේ සැළකිය හැකියි. 1950 දසකයේ මුල් හරියේ ලෝක සෞඛ්‍ය සංවිධානය (W. H. O.) ලෝක ව්‍යාප්ත මැලේරියා මර්දන ව්‍යාපාරයක් ඇරඹීය. ඩී. ඩී. ටී. (Dichlorodiphenyldichloroethane ) යොදා ගනිමින් මැලේරියාව ප්‍රචලිතව තිබූ නිවර්තනික රටවල දියත් කරන ලද එම ව්‍යාපාරය බෙහෙවින් සාර්ථක විණ. ශ්‍රී ලංකාව එම ව්‍යාපාරයේ සාර්ථකත්වයට කදිම නිදසුන සේ ලොව සෞඛ්‍ය අංශ විසින් බොහෝ විට හුවා දක්වන ලදී. ඇනෝෆිලස් (Anopheles Culicifacis) මදුරුවා මර්දනය කිරීම සියයට 99.99ක් සාර්ථක වුව ද, සෙසු මදුරු ප්‍රභේද තුළ ඩී. ඩී. ටී. වලට ඔරොත්තු දීමේ ශක්තියක් ජනිතව ඇති බැව් 1951 වසරේදී අනාවරණය විය. ඒ ග්‍රීසියෙහි සිදුකල පරීක්‍ෂණයකිනි. ඊට වසර තුන හතරකට පසු වෛද්‍ය ක්‍ෂෙත්‍රය තිගැස්සූ සොයා ගැනීම් කීපයක් විය. Plasmodium Falcifarum නැමති මැලේරියා පරජීවියා ද යටකී ඔරොත්තුදීමේ ශක්තිය ලබා ඇති බව ඉන් එකකි.

අද ලංකාවේ මැලේරියා රෝගීන් ලක්‍ෂ ගණනක් සිටිති. මදුරු උවදුරෙන් පීඩා නොවිඳින ප්‍රදේශයක් දිවයිනේ නොමැත. රටේ අගනුවර හා තදසන්න පෙදෙස්හි එම උවදුර අතිශයින් බලවත් ය. මාරාන්තික වූ මොළයේ මැලේරියාව (Malaria Falcifarum) හා විශේෂයෙන් ම බාල පරපුරට විපත්ති කර එන්කෙපලයිටිස් සහ ඩෙංගු (Dengue) දැන් අප රටේ බොහෝ පළාත්වල හමුවේ. ඉන් මියගිය පිරිස් පිළිබඳ වාර්තා එදිනෙද පුවත්පත් වල පළවේ. අප්‍රිකානු රටවල තත්වය මීටත් වඩා බරපතල ය. ඒ රටවල බාල දරුවන්ගෙන් සියයට සියයක්ම වයස අවුරුදු පහ වන විට මැලේරියාවෙන් පෙළෙන බැව් මෑතදී අනාවරණය වී ඇත. අද ලෝකයේ සීග්‍රයෙන් නැගී එන පරජීවී රෝගාබාධ බොහෝ ය. අප්‍රිකානු නිද්‍රාබාධය (Trypanosomiasis) ඉන් එකකි.

අප්‍රිකානු ගොළුබෙලි උණ (Schistosomiasis) අනිකකි. අද අප්‍රිකානු රටවල් රැසක් මෙම රෝග දෙකින් පීඩිතව ඇත. ඒ රටවල අස්ථිර ආණ්ඩු වලට ඒවා මැඩීමට කවර අංශයක වත් සවියක් නැත. මිසරය වැනි රටවල අලුතින් ඉදිකර ඇති අස්වාන් වැනි විශාල බැම් සහ කුඩා වේලි හේතුකොට ගෙන ජලය රැඳීම නිසා ගොළුබෙල්ලන්ට හිතකර පරිසරයක් මැවුණු බවත් ජලය ගෙන යන ඇළ මාර්ග ඔස්සේ උන් ඇත ප්‍රදේශ කරා ව්‍යාප්ත වන බවත් අනාවරණය වී ඇත.

මේ රෝග වාහක ගොළුබෙල්ලා ලංකාවේ ද වාසය කරයි. මහවැලි වැනි වාරි ව්‍යාපාර නිසා උන් වැඩිවීමටත් ප්‍රදේශ රාශියකට ඇළ මාර්ග ඔස්සේ පැතිර යාමටත් ඇති

කැලෑබද පෙදෙස් හා කුඹුරු ඔිවිටි ආදිය නිවහන කොටගත් තලගොයින් මරා කෑම හා නයි පොලොන් ගැරඩි ආදී සර්පයක් දුටු තැන මරා දැමීම යන දෙකරුණ නිසා ඒවායේ මීයන් බෝවිණ. දැන් මේ මීයෝ භයානක රෝගයක් පතුරුවමින් සිටිති.

ඉඩකඩ විශාල ය. මැද පෙරදිග සිට මෙරටට එන දහස් සංඛ්‍යාත ජනයා මගින් අප්‍රිකානු ගොළුබෙලි උණ බෝකරන පරජීවියාට මෙරටට ඒමට අපූරු මාවතක් ඉදිවී තිබේ.

මේ අතර (Tsetse) නම් මැස්සා මගින් බෝවන අප්‍රිකානු නිද්‍රාබාධය හටගන්වන පරජීවියා නැගෙනහිර පළාතෙන් හමුවී ඇත. ලං යටකී මාවත ඔස්සේ පැමිණි බවට සැකයක් නැත. මෙහි ඇති ඡායාරූප බලන්න.

මෑත භාගයේ අප රටේ විවිධ පළාත් වලින් බැක්ටීරි ගණයට අයත් පරජීවියකු ශරීර ගතවීම නිසා හටගන්නා මාරාන්තික උණ රෝගයක් ගැන වාර්තා වෙයි. කුඹුරු හා ජලාශ ආශ්‍රිතව ජීවත්වන කැලෑ මීයකුගේ සිරුර තුළ වසන ලෙප්ටොස්පයිරා (Leptospira Interogans) නම් බැක්ටීරියාව උගේ මළ මූත්‍ර මගින් ජලාශ වලට වැටේ. ඒ ජලය නැවරුණ මනුෂ්‍යයන්ගේ සමේ පළුදු තුළින් බැක්ටීරියාව සිරුරට වැද ගනී. මීට වැඩිපුරම ගොදුරු වන්නේ ගොවීහු ය. මෙය ඉදිරි අනාගතයේ මහත් ව්‍යසනයක් බවට පත්වන ලකුණු පෙනේ.

දුප්පත්කම දේශපාලන අස්ථිරත්වය හා නොදැනුවත්කම රජයන ආසියා අප්‍රිකා සහ ලතින් ඇමරිකානු රටවල් පසෙක තබමු. හැම අතින් ම බලවත් එක්සත් ජනපදයත් පරජීවී රෝග වලින් බේරී නැත. මහාමාරිය, එන්කෙපලයිටිස්, රහස හා පුල්ලි උණ ඉන් ප්‍රධාන ය. මේ හැම රෝගවල වාහකයන් වන්නේ සිව්පාවුන් හා පක්ෂීන් ය. බටහිර එක්සත් ජනපදයේ මහාමාරිය රෝග වාහකයන්ව සිටින්නේ බිම් ලේනුන් ප්‍රධාන වනචාරී කෘන්තකයන් ය. (Rodents) උන්ගේ ශරීරවල වසන මැක්කන් (Fleas) කැලෑබද පෙදෙස්වල දැව කර්මාන්තය කෘෂි කර්මාන්තය හා දඩයම ආදී කටයුතුවල යෙදෙන මනුෂ්‍යයන්ට දෂ්ඨ කළ විට, මැක්කන්ගේ සිරුරු තුළ සිටින සීමිත පරජීවීහු මිනිස් සිරුරට පිවිසෙති.

තවත් එවන් රෝගයකි කහ උණ. වනාන්තරවල උස් තුරු ගොමුවල වසන මදුරු වර්ගයක් (Haemagogus) වඳුරන්ගේ රුධිරයෙන් යැපෙති. කැලෑ පාළු කිරීම නිසා වඳුරෝ තම වාසභූමි හැර යති.

මදුරුවෝ බිමට බැස වඳුරන්ගේ හිලව්වට මනුෂ්‍යයන්ට විදිති. එවිට රෝග කාරක වයිරස (Flavivirus) මිනිස් සිරුරට ඇතුළු වේ.

එක්සත් ජනපදයේ පවත්නා එන්කෙපලයිටිස් රෝගය වනචාරී පක්ෂීන් හා අශ්වයන් තුළ වැඩෙන පරජීවියකු (Bunyavirus) මදුරුවකුගේ මාර්ගයෙන් මිනිස් සිරුර තුළට පිවිසීම නිසා වැළඳෙන්නකි. මෙම රෝගය ව්‍යාප්ත වීමට පක්ෂි මදුරු අශ්ව මිනිස් හා වයිරස යන කුදු මහත් ජීව ගණයා අතට එක්තරා සබැඳියාවක් ඇතිවිය යුතු ය.

අද ලක්වැසි අප ද මෙම රෝගයේ තර්ජනයට ලක්ව සිටිමු. මෙහිදී ගෘහවාසී උණ රෝගය පිළිබඳ ක්‍රියාදාමයේ පුරුකක් බැව් අනාවරණය වී ඇත. එක්සත් ජනපදයේ ප්‍රචලිත රෝගයක් වූ පුල්ලි උණ (Spotted Fever) ලේන් වල්මී ඔපොසම් රුකුන් හා ප්‍රෙයරි ඩෝග් යන ක්ෂීරපායී වනචාරී සත්ව වර්ගවල සිරුරේ වසන මැක්කකු මගින් හට ගනී. මෙම මැක්කා රෝග කාරක පරජීවියාගේ වාහකයා ය.

මුලින් රොකි කඳුකරයට සීමාවී තුබූ පුල්ලි උණ ආක්‍රමණය කර තිබේ.

පරජීවියාගේ නම Rickettsia Rickettsii ලෙසින් දැක්වේ. එහි විවිධ ප්‍රභේද ඇත. ඒවා එක්සත් ජනපදය පුරා ම රෝගය ව්‍යාප්ත කරති.

රෝගාබාධ වලින් ගැලවීමට අප හමුවේ ඇති මාර්ග මොනවාද? සිවුපා හා පක්ෂි ගණයා මගින් මිනිසා කරා රෝග පැමිණෙන නිසා උන් හැම නසා දැමිය නොහැකි ද?

එය කිසිසේත් ම කළ නොහැක. එසේ කිරීම ප්‍රායෝගික වශයෙන් දුෂ්කරවා පමණක් නොව ඉතා නුසුදුසු ක්‍රියාවකි. එයින් පාරිසරික සමතුලනය බාධා වී වෙනත් දැවැන්ත ව්‍යසන උද්ගත විය හැකි බැවිනි. අප කලින් සඳහන් කළ මී උණ ගනිමු.

කැලෑබද පෙදෙස් හා කුඹුරු ඔිවිටි ආදිය නිවහන කොටගත් තලගොයින් මරා කෑම හා නයි පොලොන් ගැරඩි ආදී සර්පයක් දුටු තැන මරා දැමීම යන දෙකරුණ නිසා ඒවායේ මීයන් බෝවිණ. දැන් මේ මීයෝ භයානක රෝගයක් පතුරුවමින් සිටිති.

වසූරිය ගලපටලය හා පෝලියෝ වැනි රෝග විෂයෙහි මිනිසා ලබා ඇති ජයග්‍රහණ අති විශිෂ්ඨ ය. සිරුරේ අභ්‍යන්තර රෝගාබාධ හඳුනා ගැනීමට නිපදවා ඇති M. R. I (Magneric Resonance Imaging) C. T.. (Computed Tomography) D. S. A. (Digital Subtraction Angiography) හා SONO වැනි පරිලෝකන (Scanning) ක්‍රම අද්විතියයි.

අද මූත්‍රාශය හා පිත්තාශය ආදී තන්හි ඇති ගපල් යර්ල කුඩු කර දැමීමට ලේසර් කිරණ චිකිත්සාව භාවිත කෙරේ. කන්තුක – වාහිනී (Cardio - Vascular) රෝග අංශයේ හදවත් බද්ධ කිරීම හා බයිපාස් සැත්කම ආදිය නිසා ඇතිවී තිබෙන දියුණුව සුවිශේෂ ය. එහෙත් තවත් බොහෝ රෝගාබාධ විෂයෙහි මිනිසා බොහෝ පසුබා සිටී. ඇතැම් වයිරස අප තුළ ප්‍රතිශක්තිය වැඩෙනවාට වැඩි වේගයකින් විකෘතියට (Mutation) පත් වේ. 1967 වසරේ ලෝපුරා පැතිර ගිය හොංකොං ප්‍රතිශ්‍යාව (Hong Kong flu) වැළැක්වීමට ගත් ආයාසය සාර්ථක නොවී ය.

එවර පැතිර ගිය වයිරස විකෘතිය එතරම් සැර පුරුෂ එකක් නොවූවද, එහි ඊළඟ වාකෘතිය ඉතා ප්‍රචණ්ඩ මාරාන්තික එකක් (බාල පරපුරට) විය හැකි ය. එය මර්ධනය කරන්නේ කෙසේ ද? යන්න නොවිසඳුන ගැටළුවකි.

වායු දූෂණය හා වායු වාහක ශ්වසන ආබාධ අතර දැඩි සබඳියාවක් ඇත. සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) වැනි වායු දූෂණ (Pollutants) නිසා ශ්වසන පද්ධතියේ ආරක්ෂක පක්ෂම (Celia) දුර්වල වේ. අවිසංවේදී වේ. එවිට ආක්‍රමණික රෝග බීජ බාධාවකින් තොරව සිරුර තුළට වැද ගනිති.

එවන් අනාරක්ෂිත ශ්වසන පද්ධතිය තුළට නව විකෘතියකට අයත් රෝග බීජ ඇතුළු වූව හොත් මහා විපතක් සිදුවනු නිසැකයි.

වර්තමානයේ අධික වශයෙන් සිදුවන ගුවන් ගමන් නිසා රෝග බීජ රටින් රටට සංක්‍රමණයවීම වෛද්‍ය විද්‍යාවේ නිවාරණ කටයුතු වලට වඩා වේගයකින් සිදු වේ. පුරාණයේ රෝග බීජ ගමන් කළේ දෙපයින් සිව්පයින් හෝ පියාපත් මගිනි.

අද ඒවා ගමන් ගන්නේ සුපර් සොනික් ගුවන් යානා වලිනි.

වර්තමානයේ අධික වශයෙන් සිදුවන ගුවන් ගමන් නිසා රෝග බීජ රටින් රටට සංක්‍රමණයවීම වෛද්‍ය විද්‍යාවේ නිවාරණ කටයුතු වලට වඩා වේගයකින් සිදු වේ. පුරාණයේ රෝග බීජ ගමන් කළේ දෙපයින් සිව්පයින් හෝ පියාපත් මගිනි. අද ඒවා ගමන් ගන්නේ සුපර් සොනික් ගුවන් යානා වලිනි.